සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2020 ජූලි

## (104) ව්‍යාපාරික පරිසරය

(Business Environment)

2020-09-27
පස්වරු
[02.00 – 05.00]

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

    (1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*

    (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

    (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

    (4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

    (5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

    (6) *ලකුණු 100 යි.*

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 06

---

## <u>A කොටස</u>

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 පහත සඳහන් ඒවා අතුරෙන්, අවශ්‍යතාවයක් (need) සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) පාන්. (2) රැකියා සුරක්ෂිතතාවය. (3) ආහාර. (4) කමිස.

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, කේවලස්වාමි ව්‍යාපාරයක වාසියක් වන්නේ:

(1) අසීමිත වගකීමයි. (2) අරමුදල් සපයා ගැනීමේ දුෂ්කරතාවයි.
(3) ආරම්භ කිරීමේ පහසුවයි. (4) බොහෝ නෛතික අවශ්‍යතාවයන් පැවතීමයි.

1.3 පහත සඳහන් ඒවා අතුරෙන්, හානිපූර්ණය පිළිබඳ මූලධර්මය අදාල **නොවන** රක්ෂණය තෝරන්න:

(1) සමුද්‍ර රක්ෂණය. (2) ජීවිත රක්ෂණය. (3) ගිනි රක්ෂණය. (4) සෞඛ්‍ය රක්ෂණය.

1.4 පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යාපාරයක අභ්‍යන්තර ඇල්මැති පාර්ශවයක් වන්නේ කවුරුන් ද?

(1) සේවකයන්. (2) පාරිභෝගිකයන්. (3) සැපයුම්කරුවන්. (4) තරඟකරුවන්.

1.5 පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයේ මූලිකාංගයක් **නොවන්නේ** කුමක් ද?

(1) රජය. (2) වටිනාකම් පද්ධතිය.
(3) සංවිධානමය සංස්කෘතිය. (4) මානව සම්පත්.

1.6 පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න:

**(a)** කම්වූ රුස්වීම් විධිමත් සන්නිවේදන ක්‍රමයක් ලෙස සලකනු ලැබේ.

**(b)** අංග චලනය ද සන්නිවේදන ක්‍රමයක් ලෙස සලකනු ලැබේ.

**(c)** ශබ්දය සහ බාධා, සඵලදායී සන්නිවේදනය කෙරෙහි බලපාන භෞතික සාධක ලෙස සලකනු ලැබේ.

ඉහත සඳහන් ප්‍රකාශයන්ගෙන් නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ:

(1) **(a)** සහ **(c)** පමණි. (2) **(a)** පමණි.

(3) **(c)** පමණි. (4) ඉහත සඳහන් සියල්ලම.

1.7 ලියාපදිංචි මූල්‍ය සමාගම් අධීක්ෂණය කරනු ලබන්නේ:

(1) කොළඹ කොටස් වෙළෙඳපොළ මඟිනි. (2) ශ්‍රී ලංකා මහ බැංකුව මඟිනි.

(3) වෙළෙඳ අමාත්‍යාංශය මඟිනි. (4) වාණිජ මණ්ඩලය මඟිනි.

1.8 පහත සඳහන් ඒවා අතුරෙන්, විද්‍යුත් මුදල් සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) චෙක්පත්. (2) ණයපත් (Credit Cards).

(3) වාණිජ පත්‍රිකා (Commercial Papers). (4) සාමාන්‍ය කොටස්.

1.9 පහත සඳහන් ඒවා අතුරෙන්, හොඳ ප්‍රවාහන පද්ධතියක ලක්ෂණයක් වන්නේ කුමක් ද?

(1) වේගය. (2) සුරක්ෂිත බව. (3) පිරිවැය අවම වීම. (4) ඉහත සඳහන් සියල්ලම.

1.10 ව්‍යවසායකයන් සම්බන්ධයෙන් වූ පහත සඳහන් ප්‍රකාශන සලකා බලන්න:

**(a)** ඔවුන්ට දිනෙන් දින වෙනස්වන ව්‍යාපාරික පරිසරයට අනුගතවීමට හැකි වේ.

**(b)** ඔවුන් ව්‍යාපාරික අවදානම් ගැනීමට කැමති නොවේ.

**(c)** ඔවුන්ට දැඩි විශ්වාසයක් ඇති අතර, ඔවුන්ගේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ඍජුව ක්‍රියා කරති.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ:

(1) **(a)** පමණි. (2) **(a)** සහ **(b)** පමණි.

(3) **(a)** සහ **(c)** පමණි. (4) **(b)** සහ **(c)** පමණි.

*අංක 1.11 සිට 1.15 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය* ***සත්‍ය*** *හෝ* ***අසත්‍යදැයි*** *දක්වන්න.* ***සත්‍ය*** *හෝ* ***අසත්‍ය*** *යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.11 චෙක්පතේ මුහුණත හරහා සමාන්තර ඉරි දෙකක් පමණක් ඇඳීම, විශේෂ රේඛණයක් ලෙස හැඳින්වේ.

1.12 සීමාසහිත පොදු සමාගමක උපරිම කොටස්හිමියන් සංඛ්‍යාව 50 කි.

1.13 ඉතුරුම් ගිණුම් සහ භාණ්ඩාගාර බිල්පත්, ආසන්න මුදල් (near money) සඳහා උදාහරණ වේ.

1.14 ලෝකයේ සියලුම ව්‍යාපාර ලාභ අරමුණු කරගත් ව්‍යාපාර වේ.

1.15 තිරසාර සංවර්ධනය යනු අනාගත පරපුරේ අවශ්‍යතා සපුරාලීමේ අයිතිය උල්ලංඝනය කිරීමකින් තොරව වර්තමාන අවශ්‍යතාවයන් සපුරාලීම වේ.

*අංක 1.16 සිට 1.20 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.16** ව්‍යාපාරයක ලක්ෂණ දෙකක්(02) සඳහන් කරන්න.

**1.17** චෙක්පතක් අගරු වියහැකි අවස්ථා දෙකක්(02) සඳහන් කරන්න.

**1.18** චෙක්පතකට සම්බන්ධ පාර්ශවයන් දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

**1.19** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්හි කාර්යසාධනය ඉහළ නැංවිය හැකි ආකාර දෙකක්(02) හඳුනා දක්වන්න.

**1.20** ව්‍යාපාරයක් තුළ ආචාරධර්ම සංග්‍රහයකින් (Code of Ethics) බලාපොරොත්තු වන ප්‍රතිලාභ දෙකක්(02) සඳහන් කරන්න. (එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

හිමිකාරිත්වය මත පදනම්ව, ව්‍යාපාර සංවිධාන කේවලස්වාමි ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සමාගම් ආදී වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ. ඕනෑම ව්‍යාපාරයක පැවැත්ම සඳහා විවිධ වර්ගයේ උපකාරක සේවා අවශ්‍ය වේ. ව්‍යාපාරයක් සඵලදායී සහ කාර්යක්ෂම ලෙස මෙහෙයවීම සඳහා මුදල්, සන්නිවේදනය, රක්ෂණය, ප්‍රවාහනය හා සැපයුම් සේවා මගින් විශාල කාර්යභාරයක් ඉටුකරනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) කේවලස්වාමි ව්‍යාපාරයක ලක්ෂණ හතරක්(04) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) සඵලදායී සන්නිවේදනයේ ගුණාංග (qualities) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(c) පුද්ගලයෙකුට රක්ෂණය කළහැකි අවදානම් (risks) තුනක්(03) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

**සීමාසහිත හෙල්ත් ස්මාට් (පෞද්ගලික) සමාගම,** විශේෂිත වූ ආයුර්වේද ශාකසාර ඖෂධයක් නිෂ්පාදනය කරනු ලබන හොඳින් ස්ථාපිත කරන ලද, මධ්‍යම ප්‍රමාණයේ වගකීම සීමාසහිත සමාගමකි. මෙතෙක් සමාගමේ නිෂ්පාදිතයන් දේශීයව බෙදාහරින ලදී. දේශීය නිෂ්පාදිත, යුරෝපීය වෙළෙඳපොළට ප්‍රවර්ධනය කිරීමට රජය දක්වන උනන්දුව පිළිබඳව දැක්වෙන පුවත්පත් ලිපියක් සමාගමේ සභාපති **ගුණතිලක මහතා** මෑතකදී කියවනු ලැබීය. සමාගමක්, පොදු සමාගමක් ලෙස සංස්ථාපනය කිරීමෙන් දේශීය ව්‍යවසායකයින්ට ලබාගතහැකි මූල්‍ය අනුග්‍රහය පිළිබඳව ද මෙම ලිපියේ තවදුරටත් පැහැදිලි කොට තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) දේශීය වෙළදාම සහ විදේශීය (ජාත්‍යන්තර) වෙළදාම අතර පවතින වෙනස්කම් දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) විදේශ වෙළඳාම තුළින් **සීමාසහිත හෙල්ත් ස්මාට් (පෞද්ගලික) සමාගමට** ලබාගතහැකි ප්‍රතිලාභ තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(c) **සීමාසහිත හෙල්ත් ස්මාට් (පෞද්ගලික) සමාගම,** සීමාසහිත පොදු සමාගමක් ලෙස සංස්ථාපනය කිරීමෙන් ලැබෙන වාසි දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

**ගයාත් පෙරේරා** පිළිගත් දේශීය විශ්ව විද්‍යාලයකින් සිය ගිණුම්කරණ උපාධිය මෑතකදී සම්පූර්ණ කරන ලදී. කුඩාකල සිටම සමාජ හා පාරිසරික නියමයන්ට අනුකූලව තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කරමින් ව්‍යවසායකයෙකු වීමේ සිහිනයක් ඔහුට තිබුණි. ව්‍යවසායකයෙකු වීම සඳහා නියම වේලාව මෙය බව ඔහු තරයේම විශ්වාස කරනු ලැබේ. කෙසේවුවද ගිණුම්කරණ ක්ෂේත්‍රයේ උපාධිධාරියෙකු වන ඔහුට විශේෂයෙන් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් (ව්‍යාපාර) මුහුණදෙන අභියෝග සහ ව්‍යාපාර බිඳ වැටීම් පිළිබඳව හොඳ අවබෝධයක් තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ව්‍යවසායකයෙකුට අවශ්‍ය කුසලතා දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) ව්‍යවසායකත්වයේ තිබෙන ප්‍රතිලාභ හතරක්(04) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 04)

(c) කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් අසාර්ථකවීමට බලපාන සාධක දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

**රේඛා,** රුසියානු සහ ඕස්ට්‍රේලියානු වෙළෙඳපොලට උසස් තත්ත්වයේ හරිත තේ සහ කලු තේ අපනයනය කරන **සිලෝන් ටී සමාගමේ**, ජ්‍යෙෂ්ඨ මෙහෙයුම් කළමණාකරු ලෙස සේවය කරයි. ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙකු ලෙස පසුගිය වසර 20 තුළ ඇය ලබා ඇති අත්දැකීම් අනුව ගෝලීයකරණය තුළ ඇති ඉඩ ප්‍රස්ථා හා අභියෝග පිළිබඳ හොඳ අවබෝධයක් ඇයට ඇත. ජාත්‍යන්තර තේ කර්මාන්තය සඳහා වර්තමානයේ පවතින දැඩි තරඟකාරීත්වය සහ අනෙකුත් තේ අපනයනකරුවන්ගේ ආයතනික සමාජ වගකීම් ඔවුන්ගේ ව්‍යාපාර තුළ ක්‍රියාවට නැංවීමේ වැඩපිළිවෙල මෑතකදී ඇයගේ නිරීක්ෂණයට ලක් වී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ගෝලීයකරණයේ අවස්ථා (opportunities) දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) සමාජ වගකීම්වල ක්ෂේත්‍ර දෙකක්(02) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 02)

(c) ආයතනික සමාජ වගකීම් [Corporate Social Responsibility (CSR)] තම ව්‍යාපාර කටයුතු තුළ ස්ථාපිත කිරීමෙන් **සිලෝන් ටී සමාගමට** ලැබෙන ප්‍රතිලාභ හතරක්(04) **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 20)

### 06 වන ප්‍රශ්නය

**කොකොනට් මාට්, ජයසිරි මහතාට** අයත් ඉතාමත් ප්‍රසිද්ධ අපනයනය පාදක කොටගත් මධ්‍යම ප්‍රමාණයේ කේවලස්වාමි ව්‍යාපාරයකි. එමගින් රසකැවිලි සඳහා අවශ්‍ය පොල් ආශ්‍රිත අමුද්‍රව්‍ය නිෂ්පාදනය කරනු ලැබේ. **ජයසිරි මහතා** මෙම ව්‍යාපාරය මීට වර්ෂ 30 කට පෙර කේවලස්වාමි ව්‍යාපාරයක් ලෙස ආරම්භ කරන ලද අතර, විවිධ වූ බාධක මධ්‍යයේ පවත්වාගෙන යන ලදි. **කොකොනට් මාට්** ආයතනය ආරම්භයේදී එහි නිෂ්පාදිත දේශීය වෙළෙඳපොළ තුළ පමණක් අලෙවි කළ අතර, දැනට එහි නිෂ්පාදිත විදේශ වෙළෙඳපොළවල්වලදී ද අලෙවි කරනු ලැබේ. මෑතකදී රජය විසින් මෙම නිෂ්පාදිත ප්‍රවර්ධනය කිරීම සඳහා සහන රාශියක් හඳුන්වාදෙන ලදි.

2018 වර්ෂයේදී, **ජයසිරි මහතාට** ඔහුගේ විශිෂ්ට වූ ව්‍යවසායකත්ව නායකත්වය වෙනුවෙන් ජාතික වාණිජ මණ්ඩලය මඟින් ගෞරව සම්මානයක් පිරිනමන ලදි. **කොකොනට් මාට්** ආයතනයේ අලුතින් පත්කරන ලද සාමාන්‍යාධිකාරී **සිතුම්ලි ජයසිරි මෙනෙවිය, ජයසිරි මහතාගේ** එකම දියණිය වන අතර, ඔවුන්ගේ ව්‍යාපාරය සීමාසහිත පෞද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමෙන් ලැබෙන වාසි පිළිබඳව තම පියාට ඒත්තු ගැන්විය.

නව කළමනාකාරිත්වය හේතුකොටගෙන **කොකොනට් මාට්** ආයතනයේ කළමනාකරණ හා කර්මාන්තශාලා කාර්ය මණ්ඩලයේ බොහෝ පළපුරුදු සහ විශ්වාසවන්ත සේවකයන් වැඩි දෙනෙක් සේවයෙන් ඉවත් වෙමින් පවතී. අපනයනය පාදක කොටගත් මධ්‍යම පරිමාණ ව්‍යාපාරයක් ලෙස **කොකොනට් මාට්** ආයතනය, සැපයුම් දාම කළමනාකරණය, තත්ත්ව සහතිකවීම් වැනි බොහෝ සාධක පිළිබඳව සලකා බලනු ලැබේ. COVID-19 වසංගත තත්ත්වයත් සමඟ **කොකොනට් මාට්** ආයතනයේ නිෂ්පාදිතයන්ට විදේශ රටවලින් ඇති ඉල්ලුම පහත වැටුනු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂයේ අවසාන කාර්තුවේදී ආයතනයේ පිරිවැටුම සීඝ්‍ර ලෙස පහත වැටුණි. තවද, **කොකොනට් මාට්** ආයතනය නිෂ්පාදනයට ප්‍රමාණවත් පරිදි අමුද්‍රව්‍ය ලබාගැනීමේ දුෂ්කරතාවයකට ද මුහුණ දෙමින් සිටී. **සිතුම්ලි ජයසිරි මෙනෙවිය** අනාගතයේදී ඔවුන්ගේ ව්‍යාපාරය වර්ධනය කරගැනීම සඳහා මෙම සාධක පිළිබඳව ඇගයීමට ලක් කරමින් සිටී. **ජයසිරි මහතා** සියලුම ව්‍යාපාරික කටයුතු සහ කළමනාකාරිත්වය **සිතුම්ලි ජයසිරි මෙනෙවිය** ට බාරදී විශ්‍රාම යෑමට සැලසුම් කරමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) වගකීම සීමිත සමාගමක වාසි දෙකක්(02) සහ අවාසි දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(b) 2007 අංක 07 දරණ සමාගම් පනත අනුව **කොකොනට් මාට්** ආයතනය, වගකීම සීමිත සමාගමක් ලෙස සංස්ථාපනය කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ලියවිලි දෙකක්(02) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 02)

(c) ශ.දු.අ.ත. (SWOT) විශ්ලේෂණය භාවිතයෙන් **කොකොනට් මාට්** ව්‍යාපාරය **තක්සේරු කරන්න**. (ලකුණු 06)

(d) **කොකොනට් මාට්** ආයතනයට කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් වැදගත් වන්නේ ඇයිදැයි යන්නට හේතු තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(e) වෙළඳාමේ නව ප්‍රවණතා (trends) දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අදින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තිරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනඟා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තිරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |